# දේශගුණික වින්දනය

හිතකර දේශගුණයකින් සංයුක්ත වූ කැගලු දිසාව නිරිත දිග තෙත් කලාපයට අයත්වන්නකි. අධික වූ වර්ෂාපතනයක් මෙන්ම ප්‍රමාණික සූර්ය තාපයක්ද ලැබෙන මෙම ප්‍රදේශය සුවදායකව දිවිගෙවන්නෙකුට හිතකර පරිසරයකි. දිවයිනට බලපාන මෝසම් සංවහන හා වාසුලි යන සියලුම ක්‍රම වලින් වාර්ෂිකව මි.මී.2500-3000 දක්වා වර්ෂාපතනයක්ද ලැබීම මෙම ප්‍රදේශයෙහි දේශගුණයේ සුවිශේෂත්වය ප්‍රකට කරන්නකි. ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙ.25.7 හෙවත් පැරන්හයිඩ් 78.4 ක් වන අතර එය ලංකාවේ සාමාන්‍ය උෂ්ණත්වයෙන් පැ.1.6 ක් අඩු තත්වයකි.

